# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2315/68 – 2023 ජනවාරි මස 21 වැනි සෙනසුරාදා – 2023.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2016/93.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.12.03 දිනැති හා අංක 2256/56 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.11.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 02, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, 457 හි පිහිටි සමස්ථ ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය සහ කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 40, තැ. පෙ. 1748 හි පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.12.06 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජනවාරි මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 38630 – 25 (2023/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය

සමස්ත ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය,
අංක. 457,
ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,
කොළඹ 02.

*(පළමු පාර්ශ්වය)*

නඩු අංකය: A/67/2021.
IR/COM/03/2016/93.

*එදිරිව*

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,
තැ. පෙ. 1748, අංක 40,
නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ - 05.

*(දෙවන පාර්ශ්වය)*

අතර පවතින කාර්මික ආරාවුල

**පෙනී සිටීම :-**

| | | |
|---|---|---|
| පළමු පාර්ශ්වය වෙනුවෙන් | - | නියෝජිත එච්. ඒ. පියදාස මයා |
| දෙවන පාර්ශ්වය වෙනුවෙන් | - | නීතිඥ තිවංක කරුණාරත්න මයා<br>සහකාර සාමාන්‍යාධිකාරි<br>එස්. ඒ. එස්. තෙවරප්පෙරුම මයා |

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2021.11.23 වැනි දින බේරුම්කරු වශයෙන් මා පත්කර මා වෙත යොමු කර ඇත.

ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ යොමුව පහත පරිදි වේ:

සමස්ත ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක. 457, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ - 02.

සහ

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, තැ. පෙ. 1748, අංක 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ - 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ පාලනය වන බෝපත්තලාව ගොවිපළ ඇතුළු ගොවිපොළවල්වල සේවයේ නියුතු පහත සඳහන් සේවකයින්ට:

1. වැටුප ගෙවීමේදී,
2. ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමේ දී,
3. වාර්ෂික නිවාඩු සම්බන්ධ නිගමනය කිරීමේදී,

අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේනම්

ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ".

1. පී. ඩබ්. ගාමිණී
2. එම්. එම් රංජිත්
3. පී. ඩබ්. වසන්ත
4. එච්. එම්. ධර්මදාස
5. වයි. ජී. නිශාන්ත
6. පී. ජී. උපාලි
7. කේ. රමර්
8. ඩබ්. එම්. දිස්නා
9. එස්. ආර්. ජී. ගීතාන්ජලී
10. එල්. ජී. සීලවතී
11. කේ. ටී. අනුලාවතී
12. පී. ආර්. සුනේත්‍රා
13. ආර්. එම්. ස්වර්ණලතා
14. එම්. සාගරිකා සමන්මලී
15. කේ. එම්. රුක්මල්
16. පී. ඩබ්ලිව්. වසන්ත
17. එන්. දර්ශන ලක්මාල්
18. ඩී. එම්. විජේවර්ධන
19 එම්. එම් නන්දසිරි
20. ඩබ්. එම්. රොෂාන්ත
21. එම්. ඒ. නිශාල් චරිත්
22. ඩබ්ලිව්. එම්. ඩී. ඩී. විජේසිංහ
23. එල්. ජී. ප්‍රියන්ත කුමාර
24. ජේ. එම්. සුරංගනී ජයසේකර
25. එස්. පරමත්‍යාලන්
26. එච්. පී. ඥානසීලී
27. පී. ජී. ජයමැණිකේ
28. ටී. ජී. අයිරාංගනී
29. කේ. එම්. ඉන්ද්‍රා කුමාරි
30. කේ. කමනි ප්‍රියංගිකා
31. ඩබ්. එම්. චානක
32. එම්. එම්. හීංමැණිකේ
33. එල්. ජී. තාරක සඳරුවන්
34. එම්. ජී. ධර්මලතා
35. ඩී. එම්. ප්‍රදීප්
36. ඒ. එම්. චන්ද්‍රිකා
37. එම්. එම්. එස්. කුමාරි හේරත්
38. එන්. එස්. කුරුකුලසූරිය
39. ඩී. එම්. අරුණ ප්‍රසන්න
40. පී. ජී. ආර්. ඩී. දිල්ශාන් බණ්ඩාර

සම්බන්ධව මෙම නඩුව 2022.01.24 වන දින පස්වරු 1.40 ට බේරුම්කරු ඉදිරියේ පෙනී සිටිමින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වන වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටිමින් එම ආයතනයේ සහකාර කළමණාකරු (මානව සම්පත්) එන්. ජේ. එස්. කුමුදුනී මහත්මිය ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ගැටළු තුන සම්බන්ධයෙන් උත්තරයක් ඉදිරිපත් කරන ලදී. එදින ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත මහතෙකු පෙනී නොසිටි බැවින් ඉහත සඳහන් උත්තරයේ පිටපතක් ඉල්ලුම්කාර පාර්ශ්වයට යවන ලෙස බේරුම්කරු නියෝග කරන ලදී.

නැවතත් නඩුව 2022.02.24 වන දින පස්වරු1.30 ට කැඳවූ අවස්ථාවේදී ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි එච්. ඒ. පියදාස මහතා ප්‍රකාශ කර සිටියේ වග උත්තරකාර ආයතනයේ සහකාර සාමාන්‍යාධිකාරිතුමිය ඉදිරිපත් කර ඇති ප්‍රකාශයට තම වෘත්තීය සමිතිය එකඟ වන බවත් තම සමිතිය විසින් කරන ලද සියලු ඉල්ලීම් ඉටුවී ඇති බැවින් මෙම නඩුව ඉල්ලා අස්කර ගැනීමට අවසර පතන බවයි. ඒ අනුව බේරුම්කරු විසින් එම ඉල්ලීමට අවසර දෙන ලදී.

එසේ හෙයින් නිරාකරණය කිරීමට ආරාවුලක් නොමැති නිසා බේරුම්කරණයේ කටයුතු මෙයින් අවසන් කරමි. මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

කේ. අමරනාත් පී. රාජකරුණා,
බේරුම්කරු.

2022 දෙසැම්බර් මස 06 වැනි දින.
බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

EOG 01-0210

මගේ අංකය: IR/COM/03/2018/33.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2301/60 දරන හා 2022.10.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ, එක් පාර්ශ්වයක් වශයෙන් ගම්පහ පෙතියාගොඩ, ඇහැලගහහේන, අංක 448, එන් 06 පදිංචි පී. සී. එස්. වීරසූරිය මිය සහ කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල හි පිහිටි එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන්, බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 109/2019 දරන හා 2022.09.22 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් පී. සී. එස්. වීරසූරිය මිය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A109/2019 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2023.10.15 දින සිට අවසන් වන බවට පනතේ 20(2) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජනවාරි මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : පී. සී. එස්. වීරසූරිය,
448 N6, ඇහැලගහහේන,
පෙතියාගොඩ,
ගම්පහ.

දිනය : 2022 දෙසැම්බර් මස 15 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටයි,

2022 ඔක්තෝබර් මස 15 දිනැති අංක 2301/60 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, පී. සී. එස්. වීරසූරිය සහ එයාර්පොර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් බැඳී සිටින්නාවූ ද, 2022 සැප්තැම්බර් මස 22 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සී. එස්. වීරසූරිය,
448 N6, ඇහැලගහහේන,
පෙතියාගොඩ,ගම්පහ,

*පිටපත* : (අනෙකුත් පාර්ශ්වය)
එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල.
කටුනායක.

1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න)

2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කල යුතුය.

EOG 01 – 0211

---

මගේ අංකය: IR/COM/02/2016/157.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.12.30 දිනැති හා අංක 2208/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.11.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 හි පිහිටි ජාතික සේවක සංගමය (සේවකයින් 20 දෙනෙක් වෙනුවෙන්) සහ කොළඹ 04, බම්බලපිටිය, මෙල්බන් ඇවනියු, අංක 27හි පිහිටි සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.11.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජනවාරි මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය.**

ජාතික සේවක සංගමය,
අංක. 416,
කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.
(සේවකයින් 20 දෙනෙක් වෙනුවෙන්)

*පළමු පාර්ශ්වය සහ*

*නඩු අංකය:* A/64/2020.
*ගොනු අංකය:* IR/COM/02/2016/157.

එරෙහිව
සීමාසහිත ලංකා සීනි (පුද්ගලික සමාගම),
අංක. 27,
මෙල්බන් ඇවනියු,
බම්බලපිටිය,
කොළඹ. 4.

*දෙවන පාර්ශ්වය*

**වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 10 වන දිනදිය.**

බලතල පැවරීම.

කම්කරු, වෘත්තීය සබඳතා, සබරගමුව සංවර්ධන හිටපු අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මහතා වෙත 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත්වලින් සංශෝධිත

ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී තිබූ බලතල ප්‍රකාරව මෙහි සඳහන් ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් බත්තරමුල්ල පන්නිපිටිය පාර අංක 77 දරන ස්ථානයේ පදිංචි ටී. පියසෝම මහතා පත් කරනු ලැබීමෙන් පසු ඔහු අසනීප තත්ත්වයට පත්වීම හේතුකරගෙන එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මහනුවර කටුගස්තොට යටිවාවල අරලිය උයන අංක 339/1/D දරන ස්ථානයේ පදිංචි එල්. ආර්. සුමතිපාල වන මා වෙත භාරකරමින් නැවත IR/COM/02/2016/157 හා 2020.11.24 දිනැති ලිපිය මගින් මා පත්කරනු ලැබ තිබේ.

<u>පවත්නා කාර්මික ආරාවුලේ ස්වභාවය</u>

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත කර්මාන්ත ශාලාවේ සේවය කරන ලද පහත නම් සඳහන් සේවක සේවිකාවන් 20 දෙනාට රජය විසින් නිකුත් කරන ලද අංක 01/2013 දරන චක්‍රලේඛය පරිදි වයස අවුරුදු 60 දක්වා සේවයේ නිරත වීමට අවස්ථාව ලබා නොදී ඔවුන් වයස අවුරුදු 55 දී විශ්‍රාම ගන්වා තිබීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුව තිබේ යයි මෙහි පළමු පාර්ශ්වය විශ්වාස කිරීමත් දෙවන පාර්ශ්වය විසින් එය පැවැති නීතිමය තත්ත්වය ක්‍රියාවට නැංවීමක් ලෙස සැලකීමත් හේතුකරගෙන මෙම ආරාවුල උද්ගතව තිබේ.

<u>ආරාවුලට අදාල සේවක සේවිකාවන්ගේ නම්.</u>

1. එන්. ඩී. එම්. කරුණාතිලක.
2. ජී. එම්. එස්. බණ්ඩාර.
3. ආර්. විමලතිස්ස.
4. ඩබ්. එම්. ජයතිලක.
5. ඩී. එම්. ජයසිංහ.
6. එල්. එන්. අමරදාස.
7. ජී. එන්. ශාන්ත.
8. එම්. කේ. ලීලාරත්න.
9. ආර්. ඒ. ලෙස්ලි අමරසිංහ.
10. එල්. බී. පාලිත.
11. ආර්. එම්. ඥාණරත්න.
12. ඩී. එම්. එස්. ආනන්ද.
13. ඒ. ජී. විජේතුංග.
14. එම්. එම්. සෝමදාස.
15. පියසිරි ලංකාපුර.
16. ඩී. එම්. කුලතිලක.
17. පුෂ්ප කාන්ත ගුණවීර.
18. ආර්. එම්. පොඩිමැණිකේ.
19. අර්. එම්. කරුණාරත්න.
20. ඒ. ජී. සිරිසේන.

කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ 2017 නොවැම්බර් මස 22 වන දිනැති යොමුගත ලිපිය අනුව මෙකී ආරාවුලට ඉහත නම් සඳහන් සේවක සේවිකාවන්ගේ නම් ඉදිරිපත්ව තිබුණද අදාල නඩු විභාගයේදී පළමු පාර්ශ්වය සාක්ෂි මෙහෙයවමින් විවිධ හේතූන් මත කරුණු දක්වමින් මෙම බේරුම්කරණය වෙතින් කිසියම් සහනයක් ලබාදෙන්නේ නම් ඒ පහත නම් සඳහන් සේවකයන් පස්දෙනාට පමණක් එය අදාල කරන ලෙසට ඉල්ලීමක් කර තිබේ. පාර්ශ්වයන් විසින් නොඉල්ලන ලද සහන ලබාදීමට බේරුම්කරණය බැඳී නොමැති බැවින් ඊට අනුරූපව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. එම සේවකයන් පස්දෙනා වන්නේ,

1. එම්. කේ. ලීලාරත්න.
2. ජී. නිහාල් ශාන්ත.
3. ආර්. එම්. ඥාණරත්න.
4. අර්. එම්. කරුණාරත්න.
5. ආර්. එම්. පොඩිමැණිකෙ යනාදීන් ය.

<u>පාර්ශ්වයන්ගේ කරුණු දැක්වීම.</u>

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පණතේ 39 වන වගන්තිය යටතේ, 1959 මාර්තු මස 02 වන දිනැති අංක 11688 දරන රජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 1969 කාර්මික ආරාවුල් පණත යටතේ වූ නියෝග සංග්‍රහයේ 21 (1) දරන නියෝගයේ දැක්වෙන පරිදි

මෙම ආරවුලට හේතුවී ඇති කරුණු පිළිබඳව ඒ ඒ පාර්ශ්වයන්ට ඉදිරිපත් කළ හැකි සම්පූර්ණ විස්තර ප්‍රකාශයක් මෙම නඩුව විභාගට ගැනීමට පෙරාතුව ඉල්ලා සිටි අතර ඊට අනුරූපව පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද විස්තරයන්හි ඇතුලත් කරුණු පහත සඳහන් පරිදි සාරාංශ කර දැක්විය හැකිය.

පළමු පාර්ශ්වයේ කරුණු දැක්වීම.

- සේවා යෝජක සමාගම ඕස්ට්‍රේලියානු සමාගමක් මගින් ආරම්භ කර පසුව රජයට පවරා ගත් බවත් ඉන් අනතුරුව රජයේ අනුග්‍රහය යටතේ පරිපාලනය හා ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී රජය විසින් පත්කරන අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් පාලනය කෙරෙන ආයතනයක් බව.

- සීනි නිෂ්පාදනය කිරීම සඳහා පැල්වත්ත හා සෙවනගල කර්මාන්ත ශාලා ස්ථාපිත කර තිබෙන බව හා එම ආයතන දෙකම එකම පාලනයක් යටතේ ක්‍රියාත්මක වන බව.

- පැල්වත්ත හා සෙවනගල සේවය කරන ලද සේවකයන්ගේ පත්වීම් ලිපිවලට අනුව ඔවුන් වයස අවුරුදු 55 දී විශ්‍රාම ගතයුතු බව සහ එය නීතියක් නොවන බව.

- පවත්නා ආර්ථික හා සමාජීය වෙනසක් අනුව ව්‍යවසායන්ගේ වෙනස්කම් මත රජයේ නිලධාරින්ගේ විශ්‍රාම වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමේ සෘජු අයිතිය ලබාදී තිබෙන බව.

- අතීතයේ ලබාදුන් පත්වීම් ලිපියේ එක් නියමයක් මත අවුරුදු 55 න් විශ්‍රාම ගන්වන බව හා සමහර සේවකයින්ගේ මුහුණ බලා වයස අවුරුදු 55න් ඔබ්බට සේවා දිගු වෙනුවට කොන්ත්‍රාත් ක්‍රමයට සේවා අනියුක්ත කරමින් අඛණ්ඩව සේවය ලබා ගන්නා බව.

- සමහර සේවකයන් වයස අවුරුදු 55 න් විශ්‍රාම ගැන්වීමට කටයුතු කරන බව.

- සෙවනගල කර්මාන්ත ශාලාවේ සේවකයන්ට පත්වීම් ලිපි අනුව වයස අවුරුදු 55 න් විශ්‍රාම නොයවා අවුරුදු 60 දක්වා සේවා දිගු ලබාදෙන බව හා ඒ අනුව සේවකයන්ට දෙයාකාරයකින් සලකන බව.

- 2013.01.15 දිනැති හා අංක 01/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය යටතේ වන නියමයන් භුක්ති විඳීමේ අයිතිය සෙවනගල කර්මාන්ත ශාලාවේ සේවකයන්ට ලබාදෙමින් හා පැල්වත්ත සමාගමේ සේවකයන්ට එය ලබා නොදීමෙන් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන බව.

- පැල්වත්ත හා සෙවනගල සේවා ස්ථාන දෙකේම සේවකයන්ට සමාන පත්වීම් ලබාදී ඇති බැවින් ඒ අනුව වයස අවුරුදු 55 දී විශ්‍රාම ගතයුතු බවට ඒවායේ සඳහන් වී තිබුණත් එම නියමයන් අවලංගු නොකර හා සංශෝධනයකින් තොරව පැල්වත්ත කර්මාන්ත ශාලාවේ සේවකයන්ට පමණක් එය ලබා නොදී වෙනසක් සිදුකරන බව.

- රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන්ගේ විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කළයුතු බවට අමාත්‍ය මණ්ඩලය ගත් තීරණයක් අනුව මහා භාණ්ඩාගාර ලේකම් විසින් සියලුම අමාත්‍යාංශ ලෙකම්වරුන් හා රාජ්‍ය ව්‍යාපාරයන්හි සභාපතිවරුන් දැනුවත් කරමින් අංක 01/2013 චක්‍රලේඛය ඔවුන් වෙත යොමු කර තිබෙන බව.

- පළමු පාර්ශ්වයට අයත් සියලුම සේවකයන් යහපත් ශරීර සෞඛ්‍යයෙන් යුතු හා අති විශිෂ්ඨ සේවා පළපුරුද්දක් ඇති අය බව.

- ඔවුන්ට රැකියාව කිරීමට වසර පහක් ඉතිරිව තිබියදී ඔවුන්ගේ අකමැත්ත මත විශ්‍රාම ගැන්වීම් නිසා ඔවුන්ට වසර පහක වැටුප් අහිමිවී තිබෙන බව.

- සේවකයන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය අඩාල වී තිබෙන බව හා පවුලේ ආර්ථිකය කඩා වැටී තිබෙන බව.

එමනිසා දැනට සේවයේ යෙදී සිටින අයට වයස අවුරුදු 60 දක්වා සේවා දිගු ලබාදෙන ලෙසත් මේ වන විට සේවයෙන් විශ්‍රාම යවා ඇති සේවකයන්ට අහිමි කාල සීමාව සඳහා වැටුප් ලබාදෙන ලෙසත් ඉල්ලා ඇත.

දෙවන පාර්ශ්වයේ කරුණු දැක්වීම.

- පළමු පාර්ශ්වයේ සේවකයන් 20 දෙනා සම්බන්ධයෙන් සභන ඉල්ලා දක්වන ලද සියලු කරුණු ප්‍රතික්ෂේප කරන බව.

- මෙම කාර්මික ආරාවුලට අදාළව වග උත්තරකරුවන්ගේ ස්ථාවරය නඩු විභාගයේදී සාක්ෂිකරුවන් හා ලේඛන මගින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.

- පළමු පාර්ශ්වයේ බේරුම්කරණ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරන ලෙස හා ඉල්ලුම්කාර පාර්ශ්වයේ බේරුම්කරන ඉල්ලුම් පත්‍රය නිෂ්ප්‍රභ කරන ලෙසද ඉල්ලා ඇත.

ඉහත සඳහන් ආකාරයෙන් දෙපාර්ශ්වය විසින්ම උද්ගතව පවත්නා ආරාවුලට අදාලව කරුණු දැක්වීමෙන් පසු මෙම ආරාවුල සම්බන්ධයෙන් පාර්ශ්වයන් අතර කිසියම් සමථයක් ඇති කර ගැනීම සඳහාද අවස්ථාව ලබාදෙන ලද අතර ඊට අනුරූපව පළමු පාර්ශ්වය විසින් ඉල්ලා සිටියේ මේ වන විට එනම් 2018.06.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි පැල්වත්ත කර්මාන්ත ශාලාවේ සේවයේ නියුතුවූවන්ට සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමකින් තොරව වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව සලසා දී තිබෙන බැවින් මෙම නඩුවට අදාල සේවකයන්ටද එම අවස්ථාව ලබාදීමට කටයුතු කරන්නේ නම් මෙම නඩුවට අදාල ඉල්ලීම ඉවත් කරගත හැකි බවය. මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටියේ වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමේ අයිතිය 2018.06.20 දින සිට ක්‍රියාත්මකව පවත්නා බැවින් ඉන් බැහැරව කටයුතු කිරීම අදාල කරුණක් නොවන බවය. මේ අනුව පාර්ශ්වයන් අතර සමථයක් නොවූයෙන් නඩුව විභාගයට ගෙන ඉදිරිපත් වන සාක්ෂි මත පදනම්ව සාධාරණ යුක්ති සහගත වූත් ප්‍රදානයක් ලබාදීමට තීරණය කරමින් නඩු විභාගය ආරම්භ කිරීම සඳහා ප්‍රථමයෙන්ම දෙවන පාර්ශ්වය *හෙවත්* වග උත්තරකාර පාර්ශ්වය වෙත අවස්ථාව ලබාදෙන ලදී.

<u>විසඳිය යුතු ප්‍රශ්න</u>

1. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත කර්මාන්ත ශාලාවේ සේවකයන්ට අංක 1/2013 දරන චක්‍රලේඛය අදාල වන්නේ ද?

2. එසේ අදාල වන්නේ නම් මේ අවස්ථාවේදී නඩුවට අදාල සේවකයන් සම්බන්ධයෙන් ලබාදිය යුතු සහන කවරේද?

3. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමට මෙම චක්‍රලේඛයෙන් බැහැරට කටයුතු කිරීමට බලතල හිමිවී තිබේද?

4. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමට පැල්වත්ත කර්මාන්ත ශාලාවේ නඩුවට අදාල සේවක සේවිකාවන් සඳහා මේ පිළිබඳව දැනටමත් කිසියම් සහනයක් ලබාදී තිබේ නම් ඒවා ආවරණය කර ගත යුතු ආකාරය කුමක්ද?

ඉහත දැක්වෙන ප්‍රශ්න වලට විසඳුම් ලබාදීමේ අරමුණ පෙරදැරි කරගෙන මෙම නඩුව විභාගයට ගැනීම සඳහා තීරණය කරන ලද අතර ඒ අනුව පළමුවෙන් සාක්ෂි මෙහෙයවීම දෙවන පාර්ශ්වය විසින් ආරම්භ කිරීම සඳහා අවස්ථාව ලබාදෙන ලදී. එහිදී වගඋත්තරකාර සමාගමේ නියෝජ්‍ය සමාන්‍යාධිකාරිවරයා සාක්ෂි දෙමින් තමන්ට වසර 33ක පළපුරුද්දක් තිබෙන බවත් සමාගමේ විවිධ අංශයන්හි සේවය කර තිබෙන බවත් ප්‍රකාශ කර ඇත. තම ආයතනයේ කළමණාකරන ශ්‍රේණි හා අනිකුත් ශ්‍රේණි වශයෙන් කොටස් දෙකක් තිබෙන බවත් ආරාවුලට අදාල සේවකයන් කළමණාකරන ශ්‍රේණිවලට අදාලව සේවය කරන අය නොවන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර තිබේ. මෙම සේවකයන් වෙත පත්වීම් ලිපි නිකුත් කර තිබෙන බවත් ඒවායේ විශ්‍රාම යා යුතු වයස වශයෙන් අවුරුදු 55 දක්වා තිබෙන බවත් ඔහු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටියේය. සේවකයෙකු විශ්‍රාම ගැන්වීමේදී අවුරුදු 55 ලඟා වෙද්දී වසරකට පෙර වශයෙන් හා මාස 3කට පෙර වශයෙන් ලිඛිතව දැනුම්දීම් කරන බවද ප්‍රශ්ණයකට පිළිතුරු දෙමින් ඔහු කරුණු දක්වා තිබේ.

මෙම සමාගම පාඩු ලබන ඌණ උපයෝගිතා පනත යටතේ රජය විසින් පවරා ගත් බවත් තම මතකයේ හැටියට ඒ වර්ෂ 2011 දී බවත් ඔහු වැඩිදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර තිබේ. මුල් අවස්ථාවේදී නිශ්චල දේපල පමණක් පවරාගත් නිසා පසුව කළමණාකාරීත්වයට පාලනය සම්බන්ධයෙන් නිදහසක් ලැබී තිබුණු බවද ඒ හැරුන විට අංක 01/2013 දරන චක්‍රලේඛයේ නිලධාරීන් පිළිබඳව සඳහන් වන බවත් මෙම ආරාවුලට අදාලවූවන් සේවකයන් බවටත් එමනිසාම ඔවුන්ට එකී චක්‍රලේඛය අදාල කර ගත නොහැකි බවටත් මතයක් ගෙනහැර දැක්වීමටද සාක්ෂිකරු උත්සාහ දරා තිබේ. එහෙත් අදාල චක්‍රලේඛයෙහි ශිර්ෂය "රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන් විශ්‍රාම ගැන්වීමේ වයස" යනුවෙන් සඳහන්ව තිබීමෙන් එම තර්කය බැහැර කරමි. තවද, වයස අවුරුදු 55 න් ඔබ්බට සේවා දිගු ලබාදීමේදී ඔවුන්ගේ මුල් සේවක අර්ථ සාධක අංකය යටතේම ඔවුන්ගේ ඉල්ලීම මත අදාල අංශයට ඔවුන්ගේ සේවය අවශ්‍ය නම් අංශ ප්‍රධානියාගේ නිර්දේශයන් මත විනය හා කාර්ය සාධනය යහපත් නම් සේවා දීර්ඝ කිරීම් ලබාදෙන බවත් කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාදීමේදී ඔහුගේ කාර්යක්ෂමතාවය, කාර්ය සාධනය මෙන්ම සේවා අවශ්‍යතාවය මත අනුප්‍රාප්තිකයෙකු නොමැතිවීම හේතුකරගෙන එසේ කොන්ත්‍රාත් සේවය ලබාදෙන බවත් සාක්ෂිකරු පැහැදිලි කර සිටියේය. එහෙත් මේ සම්බන්ධයෙන් වූ කරුණු විග්‍රහාත්මකව සලකා බැලීමේදී දීර්ඝ කිරීම් හා කොන්ත්‍රාත් පත්වීම් ලබාදීම් අතර සපුරාලිය යුතු අවශ්‍යතාවයන්ගේ පැහැදිලි වෙනස් තත්ත්වයක් දැකිය නොහැකි වුවත් පත්වීම් ස්වරූපය අනුව දෙයාකාරයක සැලකීමක් පැහැදිලිවම දැකිය හැකි වෙයි. එහෙත් ඒ සඳහා පැහැදිලි පදනමක් අනුගමනය කර තිබෙන බවක් නොපෙනේ. ඔහු සාක්ෂි දෙමින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ පැල්වත්ත හා සෙවනගල යන කර්මාන්තශාලා දෙකම එකම අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පාලනය වන බවයි. එම අධ්‍යක්ෂක මණ්ඩලය පත් කරනු ලබන්නේ අමාත්‍යාංශයෙන් බවද ඔහු පිළිගත්තේය. අසන ලද හරස් ප්‍රශ්ණයකට පිළිතුරු දෙමින් රජය විසින් ප්‍රතිපත්ති මත ගන්නා තීන්දු තීරණ අනුව චක්‍රලේඛ නිකුත් කලත් එම ආයතනය ඒවා ක්‍රියාත්මක කරන්න බැඳිලා නැති බවද ප්‍රකාශ කර සිටියේය. වසර 33 ක් වැනි දීර්ඝ කාලයක් නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කර ඇතැයි කියන සාක්ෂිකරු සෙවනගල හා පැල්වත්ත කර්මාන්තශාලා

දෙකම එකම අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පාලනය වන බවද ප්‍රකාශ කරයි. එහෙත් අසන ලද ප්‍රශ්ණයකට පිළිතුරු දෙමින් සෙවනගල සේවය කරන සේවකයන්ට ඉල්ලීමකින් තොරව වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට හැකියාව තිබෙන බවක් තමන් නොදන්නා බවද ප්‍රකාශ කරයි. මෙය පිළිගත හැකි ප්‍රකාශයක් නොවේ. ඒ කෙසේ වෙතත් වගඋත්තරකාර ආයතනය 2018/HR/02 අංකය දරන හා 2018.07.18 දිනැතිව චක්‍රලේඛයක් නිකුත් කරමින් වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55න් ඔබ්බට ඉල්ලීමකින් තොරව වසය අවුරුදු 60 දක්වා සේවයේ රැඳී සිටිය හැකි බවට දැනුම් දී තිබේ. එය පළමු පාර්ශ්වය විසින් A2 ලෙස සළකුණු කරන ලද අතර එහි ක්‍රියාත්මක දිනය වන්නේ 2018.06.20 දින බවද දක්වා ඇත. සාක්ෂිකරු එය පිළිගනිමින් කරුණු දක්වා තිබේ. එම චක්‍රලේඛනයට පදනම් වී ඇත්තේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013 වන අතර එය ක්‍රියාත්මක විය යුතු වන්නේ 2013.01.01 දින සිටය. එහෙත් වග උත්තරකාර ආයතනය තම සේවකයන්ට වයස අවුරුදු 60 දක්වා ඉල්ලීමකින් තොරව සේවය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත්තේ 2018.06.20 වන දින සිටය. ඒ අනුව වසර 5කට අධික කාලයක් අදාල චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක කිරීමට මෙම සමාගම ප්‍රමාද කර ඇතත් එයට පිළිගත හැකි හේතුව ඉදිරිපත් කර නැත. ඒ පිළිබඳව ඉදිරිපත් කර ඇති එකම හේතුව වන්නේ ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිය යුතු වීමයි. වර්ෂ 2013.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතුව තිබූ නියෝගයක් 2018.06.20 දින දක්වා ප්‍රමාද කිරීමට තරම් වූ පිළිගත හැකි වෙනත් කිසිඳු හේතුවක් නඩු විභාගයේදී වග උත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කලේ නැත. පළමු පාර්ශ්වයේ හා දෙවන පාර්ශ්වය ඉදිරිපත් කළ සාක්ෂි අනුව රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මෙම සමාගමට අදාල වන අතර මෙම සමාගම යටතේ ක්‍රියාත්මක වන සෙවනගල කර්මාන්ත ශාලාවට එය මීට පෙර සිටම අදාල බවට පළමු පාර්ශ්වය ගෙනෙන ලද තර්කය බිඳ හෙලීමට දෙවන පාර්ශ්වය සමත් වූයේද නැත. ඉන් ඉක්බිතිව පළමු පාර්ශ්වයේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙහෙයවීම සිදුවූ අතර එහිදි මුලින්ම සේවා මුර භාරකරුවෙකු සාක්ෂි ලබාදී තිබේ. ඔහු සාක්ෂි ලබාදෙමින් ප්‍රකාශ කර ඇත්තේ තම පත්වීම් ලිපිය අනු වයස අවුරුදු 55න් විශ්‍රාම ගත යුතු බවයි. ඒ අනුව 2016.04.03 දින සිට තම ඉල්ලීම මත අවස්ථා දෙකකදී සේවා දිගු ලබාදුන් බවත් පසුව 2017.04.03 දිනෙන් එකී සේවා දිගුව අවසන් වන බවත් තමාට ලිපි මගින් දැනුම්දී තිබෙන බවත් ය. පළමු පාර්ශ්වය විසින් සළකුණු කරන ලද A4, A5 හා A7 ලිපි මගින් තහවුරු කෙරේ. තවදුරටත් සාක්ෂි ලබාදෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ තමන්ගේ කාර්ය සාධනයත් සෞඛ්‍ය තත්ත්වයත් යහපත් තත්ත්වයක පැවතියදී මෙසේ විශ්‍රාම ගැන්වීම මත ආර්ථික වශයෙන් මෙන්ම මානසික වශයෙන්ද සමාජීය වශයෙන්ද විශාල හානියක් තමන්ට සිදුවූ බවයි. හරස් ප්‍රශ්ණයකට පිළිතුරු දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ තමන්ට මාස 06 බැගින් අවස්ථා දෙකකදී සේවා දිගු ලබාදීමේදී තමන්ට හිමි සේවක අර්ථ සාධක අංකය නොවෙනස්ව පැවති බවය. කිසියම් සේවකයෙකුගේ සේවා විශ්‍රාමයෙන් පසු ඔහුට කොන්ත්‍රාත් පදනම මත රැකියාව ලබාදුන්නේ නම් පෙර සේවක අර්ථ සාධක අංකයම භාවිතා කලේ යයි ප්‍රකාශ කිරීම ගැටලුසහගතය. එහෙත් මේ පිළිබඳව වගඋත්තරකාර පාර්ශ්වය හබ කිරීමක් කර නැත. සාක්ෂිකරු තවදුරටත් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ප්‍රකාශ කර ඇත්තේ තමන් විශ්‍රාම ගැන්වීමක් කර නොමැති බවත් තමන්ගේ සේවය අතරමගදී අවසන් කිරීම සිදුකර තිබෙන බවත්ය.

පළමු පාර්ශ්වය *හෙවත්* ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂිදීම සඳහා මීළඟට කැඳවා ඇත්තේ වෘත්තීය සමිති ශාඛා භාර සංවිධායකවරයෙකි. තම වෘත්තීය සමිති සාමාජිකයන්ගේ විශ්‍රාම යාමේ වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කිරීමේ චක්‍රලේඛය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා සමාගමේ සභාපතිවරයා සමග ලිපි ගනුදෙනු කල බවට ඔහු සාක්ෂි ලබාදී ඇති අතර ඒ සම්බන්ධයෙන් සළකුනු කරන ලද A11 දරණ ලේඛනයට අනුව පැහැදිලි වන්නේ 2013 නිකුත් කරන ලද චක්‍රලේඛය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා අදාල වෘත්තීය සමිතිය කටයුතු සිදුකර ඇත්තේ 2017 වර්ෂයේදී බවය. ඒ වර්ෂ හතරක ප්‍රමාදයකින් යුතුවය. දෙවන පාර්ශ්වය *හෙවත්* වග උත්තරකාර සමාගම එකී චක්‍රලේඛයට අනුරූපව කටයුතු කිරීම ආරම්භ කර ඇත්තේ 2018.06.20 වන දින සිටය. එනම් වසර 5ක් ප්‍රමාදවය. ඒ කෙසේ වෙතත් සාක්ෂිකරු මෙහිදී ප්‍රකාශ කර ඇත්තේ 2018 ජුනි මස 20 දිනට පෙර විශ්‍රාම ගන්වන ලද සේවකයන්ට ඉන් අගතියක් සිදුවී තිබෙන බවය. එහිදී වැඩිදුරටත් සාක්ෂි ලබාදෙමින් ඔහු ප්‍රකාශ කර ඇත්තේ නඩුව පැවරීමේදී සේවකයන් විසිදෙනෙකු සම්බන්ධයෙන් සහන ඉල්ලා සිටියත් දැනට එම ස්ථාවරය වෙනස් කර සේවකයන් පස්දෙනෙකු සම්බන්ධයෙන් පමණක් සහන ඉල්ලා සිටින බවයි. එම සේවකයන් පස්දෙනාට අදාලව සම්පූර්ණ විස්තර වාර්තා A12 සිට A16 දක්වා ලේඛන සළකුනු කරමින් ඉදිරිපත් කර ඇත. දෙවන පාර්ශ්වය *හෙවත්* වගඋත්තරකාර පාර්ශ්වයේ මූලික තර්කය වූයේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2013 දරන නියෝගය තම සමාගමට අදාල නොවන බවය. තම ආයතනයේ සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55 බවට පත්වීම් ලිපිවල පැහැදිලිව සඳහන්ව තිබෙන බවද එමනිසා ඔවුන්ට වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට හිමිකමක් ලැබී නැති බවද වැඩිදුරටත් ප්‍රකාශ කර තිබේ. එම සමාගමට අදාල නොවන්නේ යැයි කියන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව වයස අවුරුදු 60 දක්වා ඉල්ලීමකින් තොරව සේවය කිරීමට ඇති අයිතිය පිළිගනිමින් සමාගම අංක 2018/HR/02 හා 2018.07.18 දිනැති චක්‍රලේඛය නිකුත් කරමින් වර්ෂ 2018.06.20 දින සිට තම සමාගම යටතේ පවත්නා පැල්වත්ත කර්මාන්ත ශාලාවේ සේවකයන්ට වයස අවුරුදු 60 දක්වා ඉල්ලීමකින් තොරව සේවය කිරීමට ඇති හැකියාව තහවුරු කර ඇත. මෙහිදී සමහර සේවකයන්ගේ පත්වීම් ලිපියෙහි විශ්‍රාම ගන්වන වයස අවුරුදු 55 වශයෙන් සඳහන්ව තිබීම ගැටලුකාරි බවක් උද්ගත කරන ලද බවට සාධක ඉදිරිපත් කළේද නැත. පත්වීම් ලිපියක ඇතුලත් කිසියම් කොන්දේසියක් සාමූහික ගිවිසුම් මත හෝ වෙනත් ප්‍රතිපත්තිමය තීරණයන් ක්‍රියාත්මක වීම මත හෝ වෙනස් විය හැකිය. එහිදී පවත්නා නෛතික තත්ත්වය වනුයේ, පත්වීම් ලිපියේ ඇතුලත් අදාල කොන්දේසිය ව්‍යංගයෙන් වෙනස් වූ බවට පාර්ශ්වයන් විසින් පිළිගැනීමය. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛන අංක 01/2013 ක්‍රියාත්මකව පැවතියදී පත්වීම් ලිපියේ ඇතුලත් විශ්‍රාම ගන්වන වයස පිළිබඳව පවත්නා කොන්දේසිය ප්‍රබල වන බවට මතයක් ගොඩනගන වග උත්තරකාර පාර්ශ්වය ඊට අනුරූපව නිකුත් කරන ලද අංක 2018/HR/02 දරන චක්‍රලේඛය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී එම තත්ත්වය නොසලකා හරිමින් සිටින බව පැහැදිලිව පෙනී යයි. වග උත්තරකාර පාර්ශ්වය එක්කෝ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛනය තමන්ට අදාල නොවේනම් එය සම්පූර්ණයෙන් බැහැර කළ යුතුය. නැතහොත් එය පිළිගනිමින් ඊට අනුරූපව කටයුතු කළ යුතුය. එසේ නොමැතිව රාජ්‍ය චක්‍රලේඛයක් මගින් දෙන ලද උපදෙස් එලෙස අනුගමනය නොකරමින් එය වසර 5ක් පමණ ප්‍රමාද කරමින් ක්‍රියාත්මක කිරීමට තම සමාගමට පවත්නා බලතල පිළිබඳව නඩු විභාගයේදී කරුණු තහවුරු

කිරීමට වග උත්තරකාර පාර්ශ්වය කටයුතු කර නොමැතිවාක් පමණක් නොව එසේ ප්‍රමාද වීමට හේතු වූ කිසියම් සාධාරණ වූත් යුක්ති සහගතවූත් කරුණු දැක්වීමක්ද සිදුකර නොමැත. පළමු පාර්ශ්වය හෙවත් ඉල්ලුම්කාර පාර්ශ්වයද තම අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඊට මැදිහත්ව කටයුතු කිරීමට එතරම් උනන්දුවක් දක්වා ඇති බවක්ද නොපෙනෙන අතර ඒ සඳහා කිසියම් හෝ උත්සාහයක් දරා ඇත්තේ වසර ගණනාවක් ඉක්මයාමෙන් පසුවය. තම අයිතිවාසිකම පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොවූයේ නම් ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමේ හැකියාව මෙන්ම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අදාලත්වය සම්බන්ධයෙන්ද දැනුවත්වීම සඳහා අවශ්‍ය තරම් අවස්ථාව තිබූ බවත් ඒ සඳහා වෙනත් බාධාවක් පැවති බවත් නඩු විභාගයේදී හෙළිදරව් නොවූ බවත් ඉතාම පැහැදිලි කරුණකි.

ප්‍රදානය

පළමු පාර්ශ්වය මෙන්ම දෙවන පාර්ශ්වය විසින්ද නඩු විභාගයේදී ඉදිරිපත් කරන ලද සියලුම කරුණු දැක්වීම් හා ලේඛණමය සාධකයන්ද සැලකිල්ලට ගැනීමේදී පහත සඳහන් තීරණයන්ට එළඹීම යුක්ති සහගත සහ සාධාරණ වන්නේය. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013 හා 2013.01.15 දිනැති චක්‍රලේඛය සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත කර්මාන්ත ශාලාවේ සේවයෙ නියුතු සේවකයන්ට අදාල වන බවට තීරණය කරමි. ඒ අනුව වර්ෂ 2013 ජනවාරි මස සිට වර්ෂ 2018 ජුනි මාසය දක්වා වූ කාලය තුල විශ්‍රාම ගැන්වීම් යටතේ විශ්‍රාම ලබන ලද පහත නම් සඳහන් සේවකයන්ට එමගින් අගතියක් සිදුවී තිබෙන බවට ද තීරණය කරමි. වග උත්තරකාර සමාගමට මෙම චක්‍රලේඛයෙන් බැහැරව කටයුතු කිරීමට බලතල හිමිවී නොමැති බවටත් හා එකී චක්‍රලේඛය සම්බන්ධයෙන් නිසි අවධානය යොමු නොකිරීමෙන් අදාල උපදෙස් ක්‍රියාත්මක කිරීම නොසැලකිලිමත් භාවයෙන් කටයුතු කර තිබීමත් මත මෙම සේවකයන්ට අසාධාරණයක් සිදුව තිබෙන බවටද තීරණය කරමි.

එමනිසා මීළගට සලකා බැලිය යුතු කරුණ වන්නේ මෙසේ අසාධාරණයකට ලක්වූ සේවකයන් සම්බන්ධයෙන් ලබාදිය යුතු සහන කවරේද යන්න පිළිබඳවය. වග උත්තරකාර පාර්ශ්වයේ මෙම ප්‍රමාදය හා නොසැලකිල්ල හේතුකරගෙන මොවුන්ට තවත් වසර 5ක් පුරාවට අඛණ්ඩව සිටිමින් සේවය ලබාදීමට තිබූ අවස්ථාව අහිමි වී ඇත. එමගින් කිසියම් මානසික පීඩනයක් හා ආර්ථික වශයෙන් හානියක් ද සිදුවී තිබෙන බවට තීරණය කරමි. ඒ අනුව ඔවුන්ට අහිමි කරන ලද සේවා කාලය සඳහා ඒ වන විට ඔවුන් ලැබූ "මූලික වැටුප" පදනම් කරගෙන වන්දි මුදලක් ලබාදිය යුතු බවටත් එකී සේවකයන් තම හිමිකම් පිළිබඳව උදාසීන ආකාරයෙන් කටයුතු කර තිබෙන බවත් පෙනී යන බැවින් එකී කාලය සඳහා ඔවුන්ට හිමි "දීමනා" ඔවුන් වෙත නොගෙවිය යුතු බවටත් තීරණය කරමි. එමෙන්ම මෙම සේවකයන් වෙත වග උත්තරකාර ආයතනය විසින් ඔවුන් විශ්‍රාම ගැන්වීමෙන් පසු කිසියම් ආකාරයක සේවා දීර්ඝ කිරීම් හෝ කොන්ත්‍රාත් පදනම මත හෝ කිසියම් කාල පරිච්ඡේදයක් සේවය ලබාදී තිබේ නම් එකී කාලය සඳහා වන්දි මුදල් ගණනය නොකළ යුතු බවටද තීරණය කරමි.

වන්දි ගණනය

මෙම නඩු විභාගයට අදාලව පළමු පර්ශ්වයේ සේවකයන් විසිදෙනෙකුගේ නාම ලේඛනයක් ඉදිරිපත් කර තිබුණද නඩුව විභාග වෙමින් පැවතියදී එකී ස්ථාවරය වෙනස් කරමින් පළමු පාර්ශ්වය හෙවත් ඉල්ලුම්කාර පාර්ශ්වය සේවකයන් පස්දෙනෙකුගේ නම් පමණක් ඉදිරිපත් කරමින් සහන ඉල්ලා සිටියේය. නොඉල්ලන ලද සහන ලබාදීමට බේරුම්කරණයට බලතල හිමිවී නොමැති බැවින් හා දෙවන පාර්ශ්වය හෙවත් වග උත්තරකාර පාර්ශ්වයද ඊට හබ කිරීමක් නොකළ බැවින් ඊට අනුරූපව කටයුතු කිරීමට සිදුවිය. එමෙන්ම පළමු පාර්ශ්වය විසින් A12 සිට A16 දක්වා ලේඛන ලකුණු කරමින් එම සේවකයන් පිළිබඳව විස්තරාත්මක තොරතුරු බේරුම්කරණය වෙත ඉදිරිපත් කරන ලදී. එසේ ඉදිරිපත් වූ කිසිඳු නමක් සම්බන්ධයෙන් හෝ එහි ඇතුලත් විස්තරයක් සම්බන්ධයෙන් හෝ වග උත්තරකාර පාර්ශ්වය කිසිඳු හබ කිරීමක්ද කර නැත. එමනිසා එසේ ඉදිරිපත් කළ තොරතුරු මත පහත පරිදි වන්දි ගණනය කිරීමද තීරණය කරමි. මෙම මුදල සේවකයන්ට ගෙවීම සඳහා ගැසට් ගත කල දින සිට මසක් ඇතුලත බටහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය. (වන්දි ගණනය උපලේඛනගතයි)

මෙම වන්දි මුදල සඳහා සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ත භාර අරමුදල් ගණනය කිරීම අදාල නොවිය යුතුය. තවද මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත එකක් බවටද තීරණය කරමි.

සහන හිමිකම් ලබන සේවකයන්ගේ නම්

| | | | |
|---|---|---|---|
| 1. | එම්. කේ. ලීලාරත්න මහතා. | රුපියල්. | 759,525.00 |
| 2. | ජී. නිහාල් ශාන්ත මහතා. | රුපියල්. | 1,205,568.00 |
| 3. | ආර්. එම්. ඥානරත්න මහතා. | රුපියල්. | 741,816.00 |
| 4. | ආර්. එම්. කරුණාරත්න මහතා. | රුපියල්. | 1,427,235.00 |
| 5. | ආර්. එම්. පොඩිමැණිකා මහත්මිය. | රුපියල්. | 1,211,115.85 |

ලෝරා සුමතිපාල
බේරුම්කරු.

වන්දි ගණනය - උපලේඛණය

| අනු. අංකය | සේවකයාගේ නම | තනතුර | උපන් දිනය | විශ්‍රාම වයස 55 | විශ්‍රාමයෙන් පසු සේවය | ලද මූලික වැටුප | අහිමි සේවා කාලය | වන්දි මුදල |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | එම්.කේ.ලීලාරත්න මහතා | කම්කරු | 1960.08.13 | 2015.08.12 | අවු.01 මාස 10 1/2 | 20,254.00 | අවු. 03 මාස 01 1/2 | 759,525.00 |
| 2 | ජී.නිහාල් ශාන්ත මහතා | සේවා මුර භාරකරු | 1961.04.04 | 2016.04.03 | අවු. 01 මාස 0 | 25,116.00 | අවු. 04 මාස 0 | 1,205,568.00 |
| 3 | ආර්.එම්.ඥානරත්න මහතා | කාර්යාල කාර්ය සහයක | 1960.10.28 | 2015.10.27 | අවු. 02 මාස 0 | 20,606.00 | අවු. 03 මාස 0 | 741,816.00 |
| 4 | ආර්.එම්.කරුණාරත්න මහතා | යන්ත්‍ර ක්‍රියාකරු | 1961.07.12 | 2016.07.11 | අවු.0 මාස 09 | 27,985.00 | අවු. 04 මාස 03 | 1,427,235.00 |
| 5 | ආර්.එම්.පොඩිමැණිකා මහත්මිය | කම්කරු | 1960.01.30 | 2015.01.29 | දින 22 | 20,474.00 | අවු. 04 මාස 11 දින 04 | 1,211,115.85 |
| | | | | | | **සම්පූර්ණ වන්දි මුදල** | | **5,345,259.85** |

EOG 01 - 0212

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.